කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
1984-2024
WMC

2026 මැයි 18

'අනුරාධපුර' අටමස්ථානාධිපති මෙන්ම ප්‍රධාන නායක හිමිපාණන් නමක වන, ඉහළම ආගමික තනතුරක් දරන පල්ලේගම හේමරතන හිමියන් විසින් 15 හැවිරිදි දැරියක අපයෝජනයට හා ලිංගික අතවරයට ලක් කිරීමේ සිදුවීම සම්බන්ධයෙන් අපගේ බලවත් කම්පනය සහ දැඩි කනස්සල්ල ප්‍රකාශ කර සිටිමු. වාර්තා වන අන්දමට මෙම අපයෝජනය 2022 වසරේදී අනුරාධපුරයේ පිහිටි විහාරස්ථානයකදී අවස්ථා කිහිපයකදී සිදුව ඇත. අදාළ නායක හිමිපාණන් අත්අඩංගුවට ගෙන අනුරාධපුර ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා විසින් රක්ෂිත බන්ධනාගාරගත කර ඇති අතර, දැනට කොළඹ බන්ධනාගාර රෝහලේ වෛද්‍ය අධීක්ෂණය යටතේ පසුවන බවට තොරතුරු වාර්තා වී ඇත. එමෙන්ම, මෙම අතවරයට අනුබල දීමේ සැකය මත අදාළ දැරියගේ මව ද රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බව වාර්තා වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) මේ සම්බන්ධයෙන් සක්‍රීයව මැදිහත් වී කටයුතු කරන බව අපි දනිමු. මෙම අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත්තේ ද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මැදිහත්වීම මත වන අතර, ඔවුන් තවදුරටත් මෙම නඩුව සම්බන්ධයෙන් සක්‍රීයව කටයුතු කරමින් සිටින බව ද වාර්තා වේ.

දරුවෙකුට එරෙහිව සිදුවූයේ යැයි කියනු ලබන මෙම ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මෙන්ම, ඉහළම ආගමික අධිකාරියක වගකීම් දරන සහ විශ්වාසයක් සහිත තනතුරක් දරන පුද්ගලයෙකු මෙයට සම්බන්ධ වී සිටීම හේතුවෙන් ද මෙම සිදුවීම මුලු මහත් සමාජයම දැඩි කැලඹීමට පත් කරනු ලබන සිදුවීමකි. බලධාරී ආයතන ව්‍යුහයන් තුළ සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ චෝදනා මඟින්, බලය, නිහඬතාව, දඬුවම් නොලබා බේරී සිටීමේ ප්‍රවනතාව (නිර්දණ්ඩනය) සහ යුක්තිය පසිඳලීමේදී වින්දිතයින්ට මුහුණ දීමට සිදුවන බාධක පිළිබඳව දුෂ්කර වුවද අත්‍යවශ්‍ය සහ තීරණාත්මක ප්‍රශ්න මතු කිරීමට අපට බල කර සිටියි.

ලිංගික ප්‍රචණ්ඩත්වය යනු හුදෙක් පුද්ගලික ක්‍රියාවක් පමණක් නොවන බවත්, අධිකාරී බලය ආරක්ෂා කරමින් ස්ත්‍රීන් සහ දැරියන් අනතුරට ලක් කරන අසමාන බල සබඳතා සහ පීතෘමූලික සමාජ ව්‍යුහයන් මඟින් එය බොහෝ විට පෝෂණය වන බවත් අපි දිගු කලක් තිස්සේ කියාසිටිමින් ඒ වෙනුවෙන් ක්‍රියාකර ඇත්තෙමු. කිසිදු පුද්ගලයෙකුගේ තත්ත්වය හෝ තනතුර, ඔවුන් පරීක්ෂාවට ලක්වීමෙන් හෝ වගවීමෙන් නිදහස් කර තැබීමට හේතුවක් නොවිය යුතු අතර, එය එසේ නොවිය යුතුමය. එබැවින්, මෙම නඩුව හුදෙක් පුද්ගල වගවීම පිළිබඳව පමණක් නොවේ. එය දැරියන් ආරක්ෂා කිරීමට ආයතන සහ පද්ධති සමත් ද යන්න, වින්දිතයන්ට බියෙන් තොරව යුක්තිය සෙවිය හැකි ද යන්න සහ ගෞරවාදරයට පාත්‍ර වන පරිශ්‍රයන් සහ බලධාරී ව්‍යුහයන් තුළ මෙවැනි ප්‍රචණ්ඩත්වයන් සිදුවන විට පවා එවාට මුහුණ දීමට සමාජය කොතෙක් සූදානම් ද යන්න සම්බන්ධයෙන් ද අදාළ වේ.

මෙම සමස්ත ක්‍රියාවලියේ සෑම අදියරකදීම දරුවාගේ අයිතිවාසිකම්, ගෞරවය, ආරක්ෂාව සහ උපරිම සුභසාධනය වෙනුවෙන් ප්‍රමුඛතාවය දිය යුතුය.

Telephone: +94-11-2690192, 2690201, 2690452, 2690453, 2690457 Fax: +94-11-2690201
Email: wmcsrilanka@womenandmedia.org Web: www.womenandmedia.org
facebook.com/womenandmediacollective twitter.com/womenandmedia
Registration No. GA 2476

56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

එබැවින් අප පහත සඳහන් කරන ඉල්ලීම් ඉදිරිපත් සිටිමු:

- චූදිතයාගේ තත්ත්වය හෝ තනතුර හේතුවෙන් ඇති විය හැකි කිසිදු බලපෑමකින්, පීඩනයකින් හෝ විශේෂ සැලකීමකින් තොර වූ, ස්වාධීන, අපක්ෂපාතී සහ කඩිනම් විමර්ශනයක් සිදු කිරීම;
- නඩු කටයුතු පුරාම වින්දිත දැරියගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීම සඳහා ළමා සංවේදී, ජ්‍යෙෂ්ඨ නීති නියෝජිතයෙකු පත් කිරීම;
- දැරිය කිසිදු අයුරකින් බියගැන්වීම්, නැවත කම්පනයට පත්වීම්, වින්දිතයාට දෝෂාරෝපණය කිරීම් හෝ ප්‍රසිද්ධියට පත්වීම්වලට ලක් නොවන බව සහතික කිරීම සඳහා දැඩි ආරක්ෂණ පියවරයන් අනුගමනය කිරීම;
- ළමා ආරක්ෂණ ප්‍රමිතීන්ට සහ වින්දිතයා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන්ට අනුකූලව, සියලුම සාක්ෂි සහ ප්‍රකාශයන් සංවේදී ලෙස සහ සංවෘත අධිකරණයක (රහසිගතව) විභාග කිරීම;
- නීතිමය ක්‍රියාවලිය පුරාම දරුවා සඳහා පුළුල් මනෝ-සමාජයීය, චිත්තවේගීය සහ ආරක්ෂණ සහාය ලබා දීම;
- මෙම කරුණෙහි ඇති බරපතලකම සහ සංවේදීතාව සැලකිල්ලට ගනිමින්, නීතිපති දෙපාර්තමේන්තුව විසින් සක්‍රිය විධිමත් අධීක්ෂණයක් සිදු කිරීම;
- නඩු කටයුතු නිරීක්ෂණය කිරීම, වින්දිත දැරියට සහාය වීම සහ වගවීම සහතික කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ජාතික කාන්තා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අඛණ්ඩව මැදිහත් වීම.

යුක්තිය ඉටු වීම යනු හුදෙක් චෝදනා ලැබූ අපරාධ සම්බන්ධයෙන් වගවීම පමණක් නොවේ; එය වින්දිතයා කේන්ද්‍ර කරගත්, ඇයගේ ගෞරවය ආරක්ෂා කරන සහ කිසිදු ආයතනයක්, සම්ප්‍රදායක් හෝ බලධාරී තනතුරක් ස්ත්‍රීන්ගේ සහ දැරියන්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාවට වඩා ඉහළින් නොසිටින බව තහවුරු කරන ක්‍රියාවලියක් ද විය යුතුය.

- කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය